# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2326/40 - 2023 අප්‍රේල් මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2023.04.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උප වගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2023 අප්‍රේල් මස 06 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි **"2023 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි"** ලෙස හඳුන්වනු ලැබේ.

2. සංශෝධිත, 2022 මැයි මස 06 දිනැති අංක 2278/21 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි, මෙමගින් තවදුරටත් සංශෝධනය කෙරේ.

3. සංයෝජිත වර්ගීකරණ සංකේතාංක **0402.21 (කිරිපිටි)** සහ **0713.40.11 (රතු සම්පූර්ණ පරිප්පු)** යටතේ භාණ්ඩ ආනයනය, ඉහත සඳහන් කර ඇති 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසිවල 6 වන රෙගුලාසියෙන් නිදහස් කරනු ලැබේ.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**4.** නෞභාර පත්‍රයේ / ගුවන් භාර පත්‍රයේ නැව් හෝ ගුවන්ගත කළ දිනට පෙර අදාළ බලපත්‍රලාභී බැංකුව මගින් නාමමාත්‍ර ඉන්වොයිසිය පූර්ව පිටසන් කිරීමක් ලබා ගැනීමෙන් තොරව, පිළිගැනීම මත ලේඛන (DA) හෝ ගෙවීම් මත ලේඛන (DP) ගෙවීම් ක්‍රම යටතේ ආනයනය කරන ලද 2023 ජනවාරි මස 19 දින සිට 2023 අප්‍රේල් මස 05 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ ඕනෑම වරායකට / ගුවන් තොටුපළකට වූ ඉහත රෙගුලාසි අංක 3 හි සඳහන් කිරිපිටි හෝ රතු සම්පූර්ණ පරිප්පු භාණ්ඩ / භාණ්ඩ තොග, එම භාණ්ඩවල නෞභාර / ගුවන්භාර පත්‍රයක් සඳහා රුපියල් 10,000 ක දඩයකට යටත්ව නිදහස් කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට මෙමගින් බලය පවරනු ලැබේ.

**5.** මෙම රෙගුලාසිවල අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත, වාණිජ බැංකු වෙත සහ වෙනත් අදාළ ආයතන වෙත "මෙහෙයුම් උපදෙස්" නිකුත් කරනු ලැබිය යුතුය.

EOG 04- 0089

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.